සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2017

## 11 ශ්‍රේණිය
## නර්තනය (දේශීය) - I පත්‍රය

නම/විභාග අංකය :- ........................................................................................ කාලය : පැය 01 යි.

සැලකිය යුතුයි:-

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරැදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.
- අයදුම්කරුවන් i කොටසත් ii උඩරට නර්තනය iii පහතරට නර්තනය iv සබරගමු නර්තනය යන කොටස් තුනෙන් එක් කොටසකටත් පිළිතුරු සැපයිය යුතු ය.

❖ අංක 1 සිට 10 තෙක් ප්‍රශ්නවල හිස්තැන්වලට සුදුසු වචන තෝරන්න.

(1) දේශීය ශාන්තිකර්ම වලින් බැහැර වූ ගායන අංගයක් ලෙස .............................. දැක්විය හැකි ය.
1. කඩතුරා කවි 2. නමස්කාර ගාථා 3. හටන් කවි 4. ග්‍රහ පංති කවි

(2) ශාන්ත නැමැති ස්ථායි භාවය නිරූපණය කිරීමේදී ශිල්පියාගේ දෑස් ................. ලෙස දිස්වේ.
1. අඩවන් වූ 2. විශාල ලෙස විවර වූ දෑස්
3. වේගයෙන් චලනය වන දෑස් 4. සෙමින් චලනය වන දෑස්

(3) ''මහනුවර පෙරහැරේ රූමත් තරුණියෝ ලස්සනට නටත්'' යැයි තොරතුරු ඉදිරිපත් කරනුයේ
1. රොබට් නොක්ස් විසිනි. 2. පාහියන් භික්ෂුව විසිනි.
3. ඉබන් බතූතා විසිනි. 4. ස්පිල් බර්ජන් විසිනි.

(4) මහා පරාක්‍රමබාහු රජුගේ සෙබලුන්ගේ අශ්වාදය පිණිස නළගන රැඟුම් දක්වා ඇති බව .................. සඳහන් කරයි.
1. මහා වංශය 2. චූල වංශය 3. ථූප වංශය 4. දීප වංශය

(5) බුදුගුණ හා තෙරුවන් ගුණ සිහි කරමින් කෙරෙන ගායන විශේෂය වන්නේ ....................... ය.
1. ටීකා සීපද 2. පැල් කවි 3. නමස්කාර ගාථා 4. ග්‍රහ පංති කවි

(6) .................. දක්වා වූ කාලය දේශීය මුහු නාට්‍ය කලාවේ ස්වර්ණමය යුගය ලෙස හැඳින්විය හැකි ය.
1. 1950 - 1960 2. 1959 - 1980 3. 2010 - 2020 4. 1971 - 1989

(7) 1930 දශකයේ ............... ගේ පැමිණීම දේශීය මුද්‍රානාට්‍ය කලාවේ ප්‍රබෝධයට හේතු විය.
1. උදය ශංකර් 2. රවීන්ද්‍රනාත් තාගෝර්තුමා
3. වල්ලතෝල් නාරායන 4. රවි ශංකර්

(8) ශාන්තිකර්මයන්හි භාවිත සැරසිලි, රංගභාණ්ඩ හා පන්දම් ආලෝකය අයත් වන්නේ ................ අභිනයටය.
1. ආංගික 2. වාචික 3. ආහාර්ය 4. සාත්වික

(9) මුරුගන් දෙවියන්ට පූජා පිණිස නර්තනය කරයි.
1. කෝලාට්ටම් 2. සෙම්බු 3. කරගම් 4. කාවාඩි

(10) ''ඉල්ලම් ගැරීම'' සිදු කරනු ලබන්නේ ............. සඳහා ය.
1. පොල් කර්මාන්තය 2. තේ කර්මාන්තය 3. රබර් කර්මාන්තය 4. පතල් කර්මාන්තය

(11) කෝලම් නාටකයේ එන චරිත බෙදා දැක්වෙන ප්‍රධාන කොටස් තුන වන්නේ,
1. මානුෂ, අමානුෂ හා සත්ත්ව චරිතයි. 2. අති මානුෂ, සත්ත්ව සහ පූර්ණක චරිතයි
3. ජස, ලෙන්චිනා හා මුදලි චරිතයි. 4. මානුෂ, කොට්යා සහ සිංහයා චරිතයි.

(12) සොකරි නාටකය ප්‍රචලිත ප්‍රදේශ වන්නේ.
1. හේවාහැට, බදුල්ල, කළුතර 2. මාතලේ, කළුන්දෑව, බදුල්ල
3. බදුල්ල, දඹුල්ල, කළුතර 4. මාතලේ, බදුල්ල, රත්නපුරය

(13) සරඹ අභ්‍යාස කිරීමේදී, විලම්භලයෙහි සිව්ගුණය හඳුන්වන්නේ,
1. මධ්‍ය ලය යනුවෙනි 2. අති විලම්භ ලය යනුවෙනි.3. තාල ලය යනුවෙනි 4. ද්‍රැත ලය යනුවෙනි.



8685

(14) මළබෙර හා වදබෙර වාදනයෙන් උපදින රසය වන්නේ,

1. වීර රසයයි. 2. අද්භූත රසයයි. 3. කරුණා රසයයි. 4. ශාන්ත රසයයි.

(15) රජුන්ගේ සහ ප්‍රභූන්ගේ ගුණ වර්ණනා කිරීම සඳහා කවිකාර මඩුවේදී ඉදිරිපත් කළ ගායන විශේෂයකි.

1. ප්‍රශස්ති කාව්‍ය 2. චාමර කවි 3. පන්තේරු කවි 4. උඩැක්කි කවි

(16) කථකලි නර්තනය ප්‍රභවය ලැබීමට හේතු වූ ආගමික ගැමි නාටක දෙකකි.

1. තෝඩායම් - පුරප්පාඩ් 2. කච්චකෙට්ට - චක්කියාර්කුත්තු

3. රාමානාට්ටම් - ක්‍රිෂ්ණාට්ටම් 4. රාමායනය - තෝඩායම්

(17) කථකලි නර්තනය ප්‍රචලිත කිරීම සඳහා 1930 දී ආරම්භ වූ ආයතනය මේ නමින් හඳුන්වයි.

1. කේරළ කලා මණ්ඩලම් 2. අඩියාර්හි කලා ක්ෂේත්‍රම්

3. ශාන්ති නිකේතනය 4. විශ්ව භාරතී විශ්ව විද්‍යාලය

- **පහත දැක්වෙන රූප ඇසුරින් ප්‍රශ්න අංක 18 - 21 දක්වා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**


A




B



C



D



(18) D රූපයෙන් දැක්වෙන වාද්‍ය භාණ්ඩය වන්නේ,

1. පක්වාජය 2. චෙන්ඩාව 3. මාදංගය 4. මද්දලය

(19) A රූපයෙන් දැක්වෙන රසය වන්නේ,

1. ශාන්ත රසයයි 2. වීර රසයයි 3. අද්භූත රසයයි 4. කරුණා රසයයි

(20) B රූපයෙන් දැක්වෙන කෝලම් නාටක චරිතය වන්නේ,

1. අණ බෙර කෝලම 2. මුදලි කෝලම 3. ජස කෝලම 4. ආරච්චි කෝලම

(21) C රූපයෙන් දැක්වෙන නාට්‍ය වර්ගය වන්නේ,

1. ශෛලිගත 2. ස්වාභාවික නාට්‍ය 3. මුද්‍රා නාට්‍ය 4. ගීත නාට්‍ය

- **ප්‍රශ්න අංක 22 - 24 දක්වා ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර පහත වගුව ඇසුරින් තෝරන්න.**

| තීරුව | 1 පේළිය | 2 පේළිය | 3 පේළිය | 4 පේළිය |
|---|---|---|---|---|
| A | වලත්තෝල් නාරායන | දෙපානො | රවීන්ද්‍රනාත් තාගෝර් | රාවණා |
| B | බෙරහඬ | කත්තී | විදුර | ක්‍රීටම් |
| C | උදය ශංකර් | ආමද් | රාස්ලීලා | නවාබ් වජිඩ් අලිෂා |

(22) ග්‍රීක නාට්‍යයක් ඇසුරින් බන්දුල ජයවර්ධන ශූරින් නිර්මාණය කළ අනුවර්තන නාට්‍ය ඇතුළත් වන්නේ,

1. 3 පේළියේ B තීරුවෙහි ය. 2. 1 පේළියේ B තීරුවෙහි ය.

3. 2 පේළියේ A තීරුවෙහි ය. 4. 4 පේළියේ A තීරුවෙහි ය.

(23) කථකලි නර්තනයෙහි උන්නතිය සඳහා පුරෝගාමී වූ පුද්ගලයාගේ නම සඳහන් වන්නේ,

1. 4 පේළියෙහි C තීරුවෙහි ය. 2. 1 පේළියෙහි C තීරුවෙහි ය.

3. 3 පේළියෙහි C තීරුවෙහි ය. 4. 1 පේළියෙහි A තීරුවෙහි ය.

(24) කථකලි රංග වස්ත්‍රාභරණ වලට අයත් අංගයක් ඇතුලත් වන්නේ,

1. 2 පේලියෙහි B තීරුවෙහි ය. 2. 2 පේලියෙහි C තීරුවෙහි ය.
3. 3 පේලියෙහි C තීරුවෙහි ය. 4. 4 පේලියෙහි B තීරුවෙහි ය.

(25) නර්තනයක් නිර්මාණය කිරීමේදී වේදිකාවේ අවකාශය පිළිබඳ වඩාත් අවධානය යොමු කළ යුතු වන්නේ,

1. ගායන ශිල්පීන් සඳහා ය. 2. පසුතල ශිල්පීන් සඳහා ය.
3. බෙර වාදන ශිල්පීන් සඳහා ය. 4. නර්තන ශිල්පීන් සඳහා ය.

(26) නර්තනයේදී ප්‍රායෝගික කොටස් භාවිත කරන ආකාරය ලියා දැක්වීම හඳුන්වන්නේ,

1. අංග රචනය යනුවෙනි. 2. ප්‍රස්ථාරකරණය යනුවෙනි.
3. අනුකරණය යනුවෙනි. 4. සංස්කරණය යනුවෙනි.

(27) ප්‍රාසාංගික නර්තන අංග නිර්මාණයේදී

1. විදේශීය නර්තන අංග යොදා ගැනීම කෙරෙහි වැඩි සැලකිල්ලක් දැක්විය යුතු වේ.
2. සංස්කෘතික සාරධර්ම ගැන අවධානය යොමු කළ යුතු වේ.
3. ගීත යොදා ගැනීම අනිවාර්ය අංගයක් වේ.
4. සාම්ප්‍රදායික නර්තනයන් ඇසුරු කිරීම වැදගත් වේ.

(28) මාත්‍රා 2 + 2 + 4 යන තාල රූපය හඳුන්වන්නේ,

1. දෙසුළු මැදුම් තුන්තිත ලෙස ය. 2. දෙසුළු මහා තුන්තිත ලෙස ය.
3. සුළු මැදුම් තුන්තිත ලෙස ය. 4. දෙමැදුම් මහා තුන්තිත ලෙස ය.

(29) නර්තනයේදී අංග ප්‍රත්‍යාංග .............. ලෙස ශරීර කොටස් වෙන්කොට දැක්වේ.

1. උපාංග 2. ගුණාංග 3. ශරීරාංග 4. පංචාංග

(30) බෞද්ධාගමික කටයුතු අවස්ථාවකදී වැඩි වශයෙන් යොදා ගනු ලබන වාද්‍ය භාණ්ඩ දෙකකි.

1. දවුල සහ ගැටබෙරය 2. හොරණෑව සහ රබාන 3. උඩැක්කිය සහ දවුල 4. දවුල සහ තම්මැට්ටම

## II කොටස (උඩරට)

(31) සාම්ප්‍රදායික උඩරට නර්තනය ප්‍රචලිත ප්‍රදේශ වන්නේ,

1. සත්කෝරළය, සතර කෝරළය සහ මහනුවර
2. සත්කෝරළය, සතර කෝරලය සහ පස්දුන් කෝරළය
3. සතර කෝරළය, හාරිස් පත්තුව සහ පස්දුන් කෝරළය
4. සතර කෝරළය, හාරිස්පත්තුව සහ පුත්තලම

(32) එකොලොස්වන ගොඩ සරඹය මේ නමින් හැඳින්වේ.

1. පැනීමේ සරඹය 2. දැල සරඹය 3. ඇල සරඹය 4. දැත පෑගීමේ සරඹය

(33) මාත්‍රා 2 + 4 දෙතිතට අයත් බෙර පදයකි.

1. දෝං පිං පිං තකට දොංතක 2. දොං දොං පිං පිං ගජිගත
3. කුදගත ගත දොම් 4. දොං පිංත ගත දොංත

(34) කොහොඹ කංකාරියේ පුද ලබන දෙවිවරු වේ.

1. කඩවර දෙවි, දොවොල් දෙවි 2. කොහොඹා දෙවි, දොවොල් දෙවි
3. පත්තිනි දෙවි, බණ්ඩාර දෙවි 4. කොහොඹා දෙවි, බණ්ඩාර දෙවිවරු

(35) මහනුවර දළදා පෙරහැරේ දැකිය හැකි උඩරට නර්තන සම්ප්‍රදායට අයත් විශේෂාංග ලෙස සැලකෙන්නේ

1. උඩැක්කිය, වේවැල් සහ වෙස් නැටුම් ය. 2 උඩැක්කිය, තෙල්මේ, වෙස් නැටුම් ය.
3. උඩැක්කිය, පන්තේරු සහ වෙස් නැටුම් ය. 4. පන්තේරු, තාලම්, තෙල්මේ නැටුම් ය.

(36) ගැටබෙර වාදනයේදී යොදා ගන්නා සතර බීජාක්ෂර වන්නේ

1. තත්, දිත්, තොං, නං 2. තත්, පිත්, තොං, නං 3. තකට, කුදට 4. තකට තකට කුදං

(37) දොංපිංත ගත දොංත වට්ටමට අයත් තාල රූපය වන්නේ,

1. සුළු මහා දෙතිත 2. මැදුම් මහා දෙතිත 3. සුළු තනිතිත 4. සුළු මැදුම් දෙතිත

(38) ''මේ ඇත්තමයි සත්ත කියනෙම්'' මෙම කව් පදය අයත් වන්නේ,

1. සැවුලා වන්නමට ය. 2. මුෂලඩි වන්නමට ය. 3. සිංහරාජ වන්නමට ය 4. නෛයඩි වන්නමට ය.

(39) උඩරට සම්ප්‍රදායට අයත් වන්නම් දෙකකි.

1. සැවුලා සහ කොවුලා 2. හනුමා සහ කුදිරඩි 3. හනුමා සහ තුරඟා 4. විරාඩි සහ ආනන්ද

(40) ''නාකු ................ තරිකිට.......... තත්පෙං, තත්පෙං තපෙං තත් පෙං'' මෙම අඩව්වේ හිස්තැන්වලට අයත් පද කොටස් තෝරන්න.

1. තක, තරිකිට 2. තරිකිට, පිකුද 3. කකට, පිකට 4. තක්කුං, තකුඳ

## III කොටස (පහතරට නැටුම්)

31. සාම්ප්‍රදායික පහතරට නර්තනය ප්‍රචලිත ප්‍රදේශ වන්නේ,
    1. රයිගම, මාතර සහ බෙන්තර වේ.
    2. රයිගම, හොරණ සහ බදුල්ල වේ.
    3. මාතර, බෙන්තර සහ රත්නපුරය වේ.
    4. මාතර, බෙන්තර සහ බලංගොඩ වේ.
32. එකොළොස් වන ඉලංගම් සරඹය වේ.
    1. ඊ..... රිම් දැහිං රෙගදිත ගත ගුද ගත්තම්
    2. ගුහිදිගදිරිකිට ගුද ගුද ගුම් දිත් තා
    3. මාතර, බෙන්තර සහ රත්නපුරය වේ.
    4. මාතර, බෙන්තර සහ බලංගොඩ වේ.
33. මාත්‍රා 2 + 4 දෙතිතට අයත් බෙර පදයකි.
    1. දොංත ගතකු ගුද
    2. දොම් තම් ගත ගදිතම් ගත
    3. ගුදිත ගුං දැහිදිතිගත
    4. ගදිත දොදොම් දොං ගදිතම්
34. දෙවොල් මඩු ශාන්තිකර්මයේ පුද ලබන දෙවිවරු වේ.
    1. දෙවොල් දෙවි, බණ්ඩාර දෙවි
    2. පත්තිනි දෙවි, කොහොඹ දෙවි
    3. කොහොඹා දෙවි, දොවොල් දෙවි
    4. දෙවොල් දෙවි, පත්තිනි දෙවි
35. දෙවුන්දර පෙරහැරේ දැකිය හැකි පහතරට සම්ප්‍රදායට අයත් විශේෂ අංග ලෙස දැක්වෙන්නේ,
    1. වෙස්, කොහොඹ කලේ 2. වෙස්, තෙල්මේ 3. තෙල්මේ, දෙවොල් 4. කවාඩි, දෙවොල්
36. පහතරට බෙර වාදනයේදී යොදා ගන්නා සතර බීජාක්ෂර වන්නේ,
    1. තත්, පිත්, තොං, නං 2. තත්, දිත්, තොං, නං 3. තකට, ජිකට 4. තකට තකට ගුද
37. ගුද ගති ගත වට්ටම අයත් තාල රූපය වන්නේ,
    1. මහා තනිතිතට ය. 2. සුළු මැදුම් දෙතිතට ය 3. මැදුම් මහා දෙතිතට ය. 4. සුළු තනි තිතට ය.
38. ''සුරිඳුනි අසන් මකියන බස් පෙම්නා'' මෙම කවි පදය ඇතුලත් වන්නේ,
    1. අනුරාග දණ්ඩ තාලය සින්දු වන්නමට ය.
    2. ශුද්ධ තාලය සින්දු වන්නමට ය.
    3. ලලිත රාග තාල සින්දු වන්නමට ය.
    4. නාතිලිංචි තාල සින්දු වන්නමට ය.
39. පහතරට සම්ප්‍රදායට අයත් වන්නම් දෙකකි.
    1. අනුරාග දණ්ඩ තාලය, හනුමා
    2. විරාඩි වන්නම, හනුමන්තා තාලය
    3. ලලිත රාග තාලය, ශුද්ධ තාලය
    4. කොවුලා වන්නම, ලලිත රාග තාලය
40. තත් ගුදගත .................. තෙයි
    ගත .................. දිත් දිත් තෙයි. මෙම ඉරට්ටියේ හිස්තැන් වලට අයත් පද කොටස් තෝරන්න.
    1. දිත්, තරිකිට 2. තත් තත්, ගුද ගුද 3. ගත, ගුදගත 4. දිත් දිත්, ගුද ගත

## IV කොටස සබරගමු නැටුම්

31. සම්ප්‍රදායික සබරගමු නර්තනය ප්‍රචලිත ප්‍රදේශ වන්නේ,
    1. රත්නපුරය, බලංගොඩ සහ කලවාන වේ.
    2. රත්නපුර, බලංගොඩ සහ හාරිස්පත්තුව වේ.
    3. රත්නපුර, කලවාන සහ සීනිගම වේ.
    4. කලවාන, සීනිගම සහ කුරුවිට වේ.
32. එකොළොස්වන දොඹින පදය වේ.
    1. තරිකිට දිරිකිට දිරිකිට
    2. කිත් තා කිත් තා ජෙජ් ජෙජ් තා
    3. දිරි කුං තරි කුං තරිකිට දිරිකිට
    4. තෙයියත් තාම් තෙයි තාම්
33. මාත්‍රා 3 + 4 දෙතිතට අයත් දවුල් පදයකි.
    1. ජිමිත කුදා දොං
    2. කුදක් තක්කිට තකට ජිමිතකු
    3. කුදක් තක්කිට තකට
    4. ජිං කිටිතත් තත් කිමිතක
34. පහන් මඩු ශාන්ති කර්මයේ පුද ලබන දෙවිවරු වේ.
    1. දොවොල් දෙවි. බණ්ඩාර දෙවි
    2. පත්තිනි දෙවි, කොහොඹා දෙවි
    3. කොහොඹා දෙවි. දොවොල් දෙවි
    4. සමන් දෙවි, පත්තිනි දෙවි
35. රත්නපුර සමන් දේවාල පෙරහැරේ දැකිය හැකි විශේෂ අංගයක් ලෙස දැක්වෙන්නේ,
    1. තෙල්මේ 2. දොවොල් 3. මහබඹා කෝළම 4. වේවැල්
36. දවුල් වාදනයේදී යොදා ගන්නා සතර බීජාක්ෂර වන්නේ,
    1. තත්, දිත්, තොං, නං 2. තත්, පිත්, තොං , නං 3. තකට ජිකට 4. තකට තකට කුද
37. ගමන් මාත්‍රය නටනු ලබන තාල රූපය වන්නේ,
    1. මැදුම් මහා දෙතිතට ය. 2. මහා තනි තිතට ය. 3. සුළු මහා දෙතිතට ය. 4. මැදුම් තනි තිතට ය.
38. ''පරපුටු වෙසෙසෙන්නේ වසන්නේ මහවන ගස් මුදුනේ'' මෙම කවි පදය ඇතුළු වන්නේ,
    1. ආනන්ද වන්නමට ය. 2. කොවුලා වන්නමට ය. 3. මණ්ඩූක වන්නමට ය. 4. සැවුලා වන්නමට ය.
39. සබරගමු සම්ප්‍රදායට අයත් වන්නම් දෙකකි.
    1. සැවුලා, ශුද්ධ තාලය
    2. විරාඩි වන්නම, හනුමන්තා තාලය
    3. කොවුලා වන්නම, මණ්ඩුක වන්නම
    4. ලලිතරාග තාලය, සැවුලා වන්නම
40. ''තාත් ............. තකට තජ්පිත් .................. තත් පිත් ගත කුදු'' මෙම අඩව්වේ හිස් තැන්වලට අයත් පද කොටස් තෝරන්න.
    1. තත් කර, තකට 2. තාත්, තකට 3. ගත්තක්. ගතක් 4. තජ්පිත්, කිනම්

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2017

## 11 ශ්‍රේණිය

## නර්තනය (දේශීය) - II පත්‍රය

**නම/විභාග අංකය :- ..........................................................................** **කාලය : පැය 02 යි.**

- ❖ **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- ❖ **පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 4 ක් ඇතුළුව ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.**

(1) සියලු ම ප්‍රශ්නවලට සුදුසු පිළිතුර ඔබගේ පිළිතුරු පත්‍රයේ අදාළ ප්‍රශ්න අංකය යොදා ඉදිරියෙන් ලියන්න.

(i) දෙවුන්දර උපුල්වන් දේවාලයේ හින්දු බාලිකාවන් 500 දෙනෙකු නර්තනයේ යෙදුණු බව ................ ගේ වාර්තාවල සඳහන් වේ.

(ii) නර්තන අධ්‍යාපනයේ ප්‍රවර්ධනය සඳහා දායක වූ ශිල්පිනියක් ලෙස ................ මහත්මිය නම් කළ හැකි ය.

(iii) ''මෙම ගිම්හාන ග්‍රිස් ම වූ කාලේ'' යන ගීතය ................. නූර්තියට අයත් ගීතයකි.

(iv) සීතාහරණ මුද්‍රා නාට්‍ය නිර්මාණය කරන ලද්දේ .................... මහතා විසිනි.

(v) විශ්මය නැමති ස්ථායි භාවයෙන් ............. රසය උපදී.

(vi) කෝලම් නාටක රංග මඩල ............. නමින් හඳුන්වයි.

(vii) දේශීය මුද්‍රා නාට්‍ය කලාව ........... යන නමින් ද හඳුන්වනු ලබයි.

(viii) හොරණ ශ්‍රී පාලි ආයතනයේ නිර්මාතෘවරයා වන්නේ ..................... මහතා ය.

(ix) වන්නම් පිළිබඳ තොරතුරු ඇතුළත් ව රචනා වී ඇති ග්‍රන්ථ 2 ක් නම් කරන්න.

(x) කථකලි නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන ගායකයා ................ නම් වන අතර සහය ගායකයා ................. නම් වේ.

(2) (i) මාත්‍රා 3 තනි තිතට අදාළ රබන් පදයක් ප්‍රස්ථාර කරන්න.

(ii) මුසලඩි වන්නම/ ශුද්ධ තාලය සින්දු වන්නම/ කොවුලා වන්නමට අදාළව එක් කවියක් ප්‍රස්ථාර කරන්න.

(iii) කුදාංග ගත දොං වට්ටම/ ගුද ගති ගත වට්ටම/ පට්ටුතාල් මාත්‍රයට අදාළ අඩව්වක් / ඉරට්ටියක් ප්‍රස්තාර කරන්න.

(3) (i) සොකරි නාටකය පැවැත්වීමේ අරමුණු 2 ක් ලියන්න.

(ii) කෝලම් නාටක රග මඩල පිළිබඳ හැඳින්වීමක් කරන්න.

(iii) කෝලම් නාටකයක චරිත නිරූපණය සඳහා නර්තන, ගායන වාදන භාවිතයට ගෙන ඇති අයුරු විස්තර කරන්න.

(4) (i) කොහොඹායක්කංකාරිය/ දෙවොල් මඩුව/ පහන් මඩුව පැවැත්වීමේ අරමුණු 4 ක් ලියන්න.

(ii) ඉහත සඳහන් ශාන්තිකර්මයක ගායනය සහිත නර්තන අංක 2 ක් නම් කර ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න.

(iii) ප්‍රධාන එක් ශාන්ති කර්මයක කතා පුවත මගින් සමාජයට ලබා දෙන යහපත් ආකල්ප පිළිබඳ කෙටි විස්තරයක් කරන්න.

(5) තෝරාගත් මාතෘකා 03 ක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(i) සතර අභිනය (ii) හටන් කවි (iii) අංග රචනය (iv) ද්‍රවිඩ ගැමි නැටුම් (v) වන්නම්

(6) රූපවාහිනී නාලිකාවල විකාශය වන නර්තන වැඩ සටහන් පිළිබඳව පහත සඳහන් කරුණු ඔස්සේ විචාරාත්මක ලිපියක් සකස් කරන්න.

(i) නර්තනය (ii) රංග වස්ත්‍රාභරණ (iii) සංගීතය හා වාද්‍ය භාණ්ඩ (iv) තාක්ෂණික ශිල්ප ක්‍රම

(7) (i) නූතන නර්තන කලාවේ ප්‍රවණතා 4 ක් ලියන්න.

(ii) සමාජයීය අවශ්‍යතා සඳහා නර්තනය භාවිත කරන අවස්ථා 2 ක් නම් කර ඒ පිළිබඳ කෙටි විස්තරයක් කරන්න.

(iii) අද්‍යතන නර්තන කලාව මූල්‍ය උත්පාදන මාර්ගයක් සේ යොදා ගෙන ඇත. අදහස් දක්වන්න.